**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2018**

**------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ((1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂයපථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| කිලිනොච්චි බස් නැවතුම්පල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම උල්ලංඝනය කිරීම නිසා ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව කරගෙන යාම අත්හිටුවා කොමිෂන් සභාව විසින් රු.4,869,212 ක් වූ ලංසු | අදාල කාර්ය සම්බන්ධව පැහැදිලි තීරණයක් ඒ වනවිට නොතිබූ බැවින් විචක්ෂණ සංකල්පය යටතේ මෙම ලංසු සුරක්ෂණ මුදල ආදායමක් ලෙස ගිණුම් ගත නොකරන ලදි. | ගෙවිය යුතු ශේෂය හා කෙරීගෙන යන වැඩ වටිනාකම් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

සුරක්ෂණය හා රු.2,438,700 ක් වූ කාර්යසාධන සුරක්ෂණය අයකරගෙන තිබුණි. එම මුදල කෙරීගෙන යන වැඩ වටිනාකමින් අඩු නොකර කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අවසානයට ගෙවිය යුතු ශේෂය හා කෙරීගෙන යන වැඩ වටිනාකම රු.7,307,912ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

### 1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 10(5) වගන්තිය | කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේදීම ඇති වන ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුවද, 2018 වර්ෂයේ රු.165,284,562ක අතිරික්තයක් ඇතිවී තිබුණද, රු.100,000,000 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. | 2017 වර්ෂයේදී රු.මිලියන 300 ක මුදලක් හා 2018 වර්ෂයේදී රු.මිලියන 100ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇත. රු.165,284,562 ක අතිරික්තය මූල්‍ය අතිරික්තයක් නොවේ. | මූල්‍ය ප්‍රකශන අනුව දක්වන මූල්‍ය අතිරික්තය රු.165,284,562 වන බැවින් එය නිවැරදි වටිනාකම ලෙස පිළිගැනීමට සිදුවේ. |
| ii) | 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, මේ දක්වා එයට පිලිතුරක් ලැබී නොමැත. | නිසි පරිදි අදාළ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.6,780,452 ක ශේෂයක් විය | | |
| (ආ) | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත 08 වගන්තිය | කොමිෂන් සභාව විසින් මගී ඉල්ලුම හඳුනාගැනීම මත මාර්ග සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සිදු කල යුතු වුවද, අධිවේගී මාර්ගයට අදාලව පමණක් සමීක්ෂණ සිදුකර තිබුණු අතර, කඩවතින් ගමන් ආරම්භකර තංගල්ල, හක්මන, කතරගම, දෙනියාය හා ඇඹිලිපිටිය මාර්ග සඳහා බස්රථ යෙදවිය යුතු බව හඳුනාගෙන තිබුණද, බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට ටෙන්ඩර් ක්‍රමවේදය සංශෝධනය කරමින් පවතී. | මගී ඉල්ලුම හඳුනාගැනීම මත මාර්ග සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සිදුකළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.165,284,562 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.169,437,153 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,152,591 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායම රු.35,731,952 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 3.1 හඳුනාගත් පාඩු
-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2005 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ටෙන්ඩර් කිරීම මත නිත්‍ය සේවා බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට අනුමැතිය ලබාදී තිබුණද, එසේ ලංසු කැඳවීමකින් තොරව කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මාර්ග බලපත්‍ර 3440 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් සියයට 64ක් වාර්ෂික අළුත් කිරීමේ ගාස්තු වන රු.3,000ක ගාස්තු අයකිරීම මත හා සියයට 27ක් වාර්ෂිකව රු.15,000 ක ගාස්තු අයකිරීම මත පමණක් ලබා දී තිබුණි. ඒ අනුව නිකුත් කරන ලද මුළු බලපත්‍ර වලින් සියයට 91ක් ටෙන්ඩර් කිරීමෙන් තොරව ලබාදීම නිසා කොමිෂන් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වි තිබුණි. එසේම කොමිෂන් සභාව අධිවේගී මාර්ගයේ බස්රථ සඳහා තාවකාලික මාර්ග සේවා අවසර පත්‍ර අවම තාක්ෂණික අගය පදනම් කරගෙන ලබාදී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී උපරිම දින 28ක කාලයක් සඳහා බලපත්‍ර 820 ක් නිකුත් කර තිබුණු අතර, ටෙන්ඩර් කිරීම මගින් ලබාගත හැකි උපරිම ආදායම අහිමි වි තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අදාල හඳුන්වා දී ඇති ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කල යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී ලංකාවේ විවිධ පළාත්වල සිට උතුරු , නැගෙනහිර දක්වා මගී සේවා අවසරපත්‍ර නොමැතිව ධාවනය කරනු ලබන බස්රථ 28ක් පමණ ජංගම පරීක්ෂණ අංශය විසින් හඳුනාගෙන තිබුණු අතර, ඒ අනුව මාර්ග 17 ක් සඳහා මගී සේවා අවසර පත්‍ර 31 ක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. මේ අනුව කොමිෂම විසින් මාර්ග 06ක් සඳහා මගී සේවා අවසර පත්‍ර 09ක් නිකුත් කිරීමට මිල ගණන් කැඳවා සාර්ථක ඉල්ලුම්කරුවන් තෝරාගෙන තිබුණද, තෝරාගත් ඉල්ලුම්කරුවන් සඳහා අවසර පත්‍ර ප්‍රදානය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම නිසා අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම මත සමාලෝචිත වර්ෂය තුළ අවසරපත්‍ර ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් කොමිෂමට වසරකට රු.25,815,000 ක ආදායමක් අහිමි වි තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය තහවුරු නොවීම නිසා නව අධ්‍යක්ෂ මණ්ඩලයට නව පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | නිසි පරිදි අදාළ අනුමැතීන් නිශ්චිත කාලසීමාවේදී ලබාගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් රැස් කිරීම කොමිෂන් සභාව පිහිටුවීමෙහි පනතේ සඳහන් අරමුණක් නොවුවද, අන්තර් පලාත් පෞද්ගලික බස් රථ සඳහා ආසන වෙන්කිරීමෙන් වර්ෂය තුලදී කොමිෂන් සභාව ආදායම් රැස්කර තිබුණි. එම කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් රු.1,428,548 ක් වූ වියදමක් දරා තිබුණද මේ සම්බන්ධයෙන් මගී ජනතාව දැනුවත් වී නොතිබුණි. | ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ අංක 09(1) යටතේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යැයි හැඟී යන ඕනෑම කටයුත්තක් කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. | මේ සම්බන්ධයෙන් මගී ජනතාව දැනුවත් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | සිසු සැරිය ව්‍යාපෘති සඳහා සිසුන් හා පාසල් විසින් ඉල්ලීම් 31 ක් ඉදිරිපත් කර තිබුණද, 2018 වර්ෂයේදී එම ඉල්ලීම් 31ම ඉටු කිරීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘති ඉටු කිරීමේදී ප්‍රවාහනය නියාමනය සිදුකරන ආයතනය ලෙස අදාල සේවාවන් සඳහා බස් යෙදවීම සඳහා යොමු කිරීම කොමිෂමේ මූලික කාර්යක් මෙන්ම සමාජ වගකීමක් වන අතර ඒ ගැන සලකා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ප්‍රවාහනය නියාමනය සිදු කරන ආයතනය ලෙස සමාජ වගකීමෙන් යුතුව කටයුතු කල යුතු වේ. |
| (ඇ) | බැස්ටියන් මාවතේ වැසිකිලි පද්ධති සඳහා වූ ආදායම් ලැබීම් පිළිබඳ පරික්ෂාවේදී එම ලැබීම්වල ප්‍රමාද වීම් නිරීක්ෂණය විය. මෙම ප්‍රමාද වීම් දින 53 සිට දින 159 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව ගිවිසුමෙහි 2 වන කොන්දේසිය උල්ලංඝනය කර ඇති අතර, 2011 පෙබරවාරි 24 දිනැති ගිවිසුමෙහි 2 වන වගන්තිය අනුව මාස 3ක කාලයක් ගෙවීම් පැහැර හැරිය හොත් ගිවිසුම අහෝසි වීමට හේතුවක් වන බව සඳහන් වුවද, ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බැස්ටියන් මාවත පොදු වැසිකිලි පද්ධතිය නඩත්තු කිරීම සඳහා වූ ගිවිසුම්පත ආයතනයේ හිමිකරු ආයතනයට කැඳවා අවවාද කර ඇත. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පනතේ 25 වන වගන්තිය අනුව වසරකට වැඩි කාලයක් සඳහා මාර්ග සේවා අවසරපත්‍ර ලබාදිය හැකි වුවද, කොමිෂන් සභාව විසින් විශාල මගී ඉල්ලුම් සහිත අවස්ථාවල නිසි අනුමැතියකින් තොරව මාර්ග සේවා අවසරපත්‍ර හිමියන් වෙත දෛනික ගාස්තු අයකිරීම යටතේ අධිවේගී මාර්ගය සඳහා මාර්ග බලපත්‍ර 7740 ක්ද, සාමාන්‍ය මාර්ග සඳහා මාර්ග බලපත්‍ර 130ක්ද, නිකුත් කර තිබුණි. | විශාල මගී ඉල්ලුමක් ඇති අවස්ථාවන්වලදී හා කාල සටහන් පුරප්පාඩු පවතින අවස්ථා වලදී තාවකාලික අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම. මෙහිදී වෙනත් මාර්ගයක ධාවනයට බලපත්‍රයක් නිකුත් කර ඇති බස් රථයන් ධාවනය සඳහා යොදවනු ලැබේ. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |
| (ආ) | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ගාස්තු ගෙවීමේ පදනම මත තාවකාලික මාර්ග සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට පැවරුම් සිදු කර තිබුණද, 2018 වර්ෂයේදි නිකුත් කරන ලද බලපත්‍ර 25 බැගින් වූ පොත් 09 ක ආදායම් හා පිටපත සහිත වූ අවසර පත්‍ර පොත් කොමිෂන් සභාව වෙත නැවත ලබාදී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තාවකාලික අවසර පත්‍ර පොත්වලින් පොත් 09 ක් හැර අනෙකුත් පොත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාරදී ඇත. | පොත් 09 ක ආදායම සහ පිටපත සහිත වූ අවසරපත්‍ර පොත් ලබා නොදීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාව පෞද්ගලික සමාගමක් සමග 2017 දෙසැම්බර් 29 දින PAS (Process Automation System) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 31,735,051ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණු අතර, ව්‍යාපෘතියෙහි සියලු වැඩ අවසන් කර 2018 නොවැම්බර් 15 දින කොමිෂන් සභාව වෙත භාරදීමට නියමිතව තිබුණද, 2019 මැයි 30 දින වන විටද, ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතියෙහි කාර්යසාධන ප්‍රගතිය පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 35ක ප්‍රමාණයක් විය. | පිළිතුරු දී නොතිබුණි. | අදාළ ගිවිසුම් පරිදි කාර්යය ඉටු කිරීමේදී කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 දෙසැම්බර් 29 දින කොමිෂන් සභාව පුද්ගලික සමාගමක් සමග රු.48,773,045 කට කිලිනොච්චි බස් නැවතුම්පොල ඉදිකිරිම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| ලංසු ලේඛන අනුව ආසන්න වර්ෂ 5 ක මූල්‍ය ප්‍රකාශන ලබා දිය යුතු අතර, ඉදි කිරීම් කර්මාන්තයෙහි පසුගිය වර්ෂ 5 තුළ අවම සාමාන්‍ය වාර්ෂික ධාරිතාවය රු. මිලියන 86 ක් විය යුතු අතර, කොන්ත්‍රාත්කරු පසුගිය වසර 5 තුළ මෙම වැඩ හා සමාන ස්වභාවයේ හා සංකීර්ණත්වයෙන් යුතු රු. මිලියන 50 ක වටිනාකමින් යුතු අවම වශයෙන් එක් ගොඩනැගිලි ව්‍යාපෘතියක් නිමා කොට තිබිය යුතු වුවත්, ලංසු ඇගයීම් ලේඛන අනුව කොන්ත්‍රාත්කරු එම කොන්දේසි කිසිවක් සම්පූර්ණ කර නොතිබුණද ඇගයීම් කමිටුව විසින් ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගේ අවම වාර්ෂික ධාරිතාව රුපියල් මිලියන 31ක් වශයෙන් දක්වා ඇතතේ කොන්ත්‍රාත්කරු මුලින් ඉදිරිපත් කරනු ලැබූ එක් වර්ෂයක මූල්‍ය ප්‍රකාශන අනුවය. කොන්ත්‍රාත්කරුගේ පසුගිය වසර 05 තුල අවම සාමාන්‍ය වාර්ෂික ධාරිතාව රු.මිලියන 86ට වඩා වැඩිය. | ලංසු ඇගයීමේදී අදාල කොන්දේසි සපුරා තිබීම නිවැරදි බව සහතික විය යුතුය. |
| (i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.(4) සහ (5) වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු පැහැර හැර තිබුණද පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට නම ඇතුලත් නොකල යුත්තේ මන්ද යන්න පිළිබඳව ලිඛිතව හේතු දක්වන ලෙස නියම කරමින් කොන්ත්‍රාත්කරු වෙත ලිඛිත දැන්වීමේ යවා නොතිබුණි. | ධර්මදාස කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස්හි කළමණාකාර අධ්‍යක්ෂ අසනීප අසාධ්‍ය තත්වත්යේ සිටින බව දන්වා කිලිනොච්චි බස් නැවතුම්පලේ ඉතිරි වැඩ කටයුතු සිදු කිරීමට නොහැකි බව ලිඛිතව දන්වා ඇත. | ප්‍රසම්පාදන විධිවිධානවලට අනුගතව කටයුතු කල යුතුවීම |
| (ii) ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම පැහැර හැරීම් නිසා කොමිෂම විසින් ගිවිසුම අවලංගු කර තිබුණි. මෙහිදී නිම කරන ලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.16,469,363ක් ගෙවීම් කිරීමේදී ගිවිසුම් පරිදි රු. 2,438,652ක් වන ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | මෙම ඉදිකිරිම සඳහා අවසන් බිල්පත ඉදිරිපත් වී නොමැති අතර එම බිල්පතට අදාල ගෙවීම සහතික පත්‍රයෙන් ප්‍රමාද ගාස්තු අඩු කරන ලෙස උපදේශක ආයතනය වෙත දන්වා ඇත. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක:පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාසයක් ප්‍රමාදවී 2019 අප්‍රේල් 17 දිනදීය. | | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතු වීම |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සිසු සැරිය,ගැමි සැරිය හා නිසිසැරිය යන සේවාවන් සඳහා බස්රථ සංඛ්‍යාව පිළිවෙලින් 100,15 හා 100 බැගින් වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, ඉන් ළඟා කර ගත් ඉලක්ක ප්‍රතිශතයන් ලෙස පිළිවෙලින් සියයට 57,27 හා 23 ක් විය. | අදාළ පළාත් මාර්ගස්ත මගී ප්‍රවාහන අධිකාරීවලින් සේවා සැපයීම සඳහා ධායකයින් ඉදිරිපත් නොකිරීම හා ශ්‍රීලංගම ඩිපෝවල පවතින සේවක හිගය බස්රථ හිගය නිසා බස්රථ යෙදවීමට නොහැකි වීම යනාදිය හේතු විය. | සැලසුම් කරනු ලැබූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුවීම |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අයවැයගත ආදායම් තථ්‍ය ආදායම් සමග සැසඳීමේදී සියයට 100 ක සිට සියයට 958.57 ක් දක්වා පරාසයක හා අයවැයගත වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 104.46 ක සිට සියයට 244.23 ක් දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් ශේෂයන් අතර විචලනයන් අවම කර ගැනීම සඳහා අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි. | විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛනය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |